**දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම) - 2018**

---

දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 24 දින එළඹි අංක 3028 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් පිළියෙල කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 790.8 කට සමාන එජඩො මිලියන 6 ක් වූ අතර ඉන් රු.මිලියන 659 කට සමාන එජඩො මිලියන 5 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. රු.මිලියන 131.8 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යයනයක් කිරීමට බලාපොරොත්තු විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 22 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

---

මාගේ මතය,ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

**කරුණු අවධාරණය කිරීම**

තත්වාගණනය නොකල මතය,උපදේශයන්හී යෝග්‍යතාවය පිළිබඳව ගැටළු ඇතත් මා ව්‍යාපෘතියට අදාල කාර්යයන්හී මූල්‍ය වාර්තා විස්තර කර ඇති අංක 4 (වැඩවල ප්‍රගතිය) වෙත අවධානය යොමු කරමි.එයට අනුව 2018 – 2027 ජාතික මාර්ගයන් හී සංයුක්ත සැලැස්මට අනුව අදාල ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීමේදී බලාපොරොත්තු වූ ප්‍රතිඵල 2018 දෙසැම්බර් 31 වන විටත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලහාකරගෙන නොතිබුණි. එයට හේතු වී ඇත්තේ උපදේශකයන් විසින් යෙදවුම් ලබා දීමේදී 2014 සිට ඇති වී තිබුණු මන්දගාමී ස්වරූපයයි.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 කළමනාකරණයේ වගකීම් සහ මූල්‍ය ප්‍රකාශන පාලනය පිළිබඳ චෝදනා

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශණ ,වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමානාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශණ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශවය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි.,තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශණවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකියයුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සංනිවේදනය කරමි.

## 2 භෞතික සමාලෝචනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික කාර්ය සාධනය.

| විස්තරය | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| උපදේශකයන් දෙපලගේම සේවාවන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2018 සිට 2027 කාලයට අදාලව මාර්ග සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා ලබා ගෙන ඇතත් 2018 දෙසැම්බර් 31 වන විටත් එය අවසන් කර නොතිබුණි. | සම්පූර්ණ කළ මාර්ග සැලසුම් යල් පැනීමේ සම්භාවීතාවයක් ඇත. | සංයුක්ත සැලැස්මෙහි අවසාන සැකසීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය සමග පවරා දී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංක | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණකගෙ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | මිගමුව - ගිරිඋල්ල ,දම්පේ - කොට්ටාව,කොට්ටාව - තලගල සහ ගාල්ල - බද්දේගම යන මාර්ග 4 සවිස්තරාත්මක සැලසුම්වලට අනුකූලව උපදේශක විසින් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය විය.කෙසේවෙතත් ඉහත මාර්ගයන් මුලින් තීරණය කරන ලද කාර්ය රාමුව තුළට අන්තර්ගත වී නොමැත. | බලය නොලත් කාර්තවයන් සිදු කිරීම නිසා ව්‍යාපෘති පිරිවැය ඉහළ ගොස් ඇත. | ලංසු තැබූ වාර්තා තුල සඳහන් මාර්ග ලැයිස්තුව පසුව වෙනස් කර තිබුණි. | මාර්ග ප්‍රමුඛතා ලැයිස්තුව ජාතික සැලැස්ම මත පවත්වාගෙන යා යුතුවේ |
| (ආ) | මාර්ග 30 කට අයත් කිලෝමීටර් 250 කට අදාලව ශක්‍යතා අධ්‍යයනයන් සහ සවිස්තරාත්මක සැලැසුම් සකස්කරනු ලබුවත්,2019 මාර්තු 14 වන විට මාර්ග 3 කට අයත් කිලෝමීටර් 24 ක් පමණක් ප්‍රති සංවිධානය සඳහා තෝරාගෙන ඇත.තවදුරටත් පරීක්ෂා කර බැලීමේදි සනාථ වූ කාර්යයක් වන්නේ මාර්ග 2 කට අයත් කිලෝමීටර් 24 ක ප්‍රතිසංවිධාන වැඩ පමණක් 2014 මාර්තු 14 වන විට ආරම්භ කර තිබුණු බව නිරීක්ශණය විය. | මාර්ග සැලසුම්කරණය සඳහා වැය කර තිබුණු පිරිවැය ඒ අනුව ඵල රහිත බවට පත්ව තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණුවලට අදාලව අරමුදල් ලැබීමේදී ඇති වූ සීමාකාරී තත්ත්වයන් හේතුවෙන් මාර්ග සංවර්ධන කටයුතුවල ආරම්භයන් ප්‍රමාද වී තිබුණි. | මාර්ගවල ප්‍රති සංවිධාන කටයුතු සැලසුම් සකස්කල වහාම ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පැන නැගී තිබුණි. |